# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.21 පැය 1520 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/111 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


## රථවාහන වැරදි කළමනාකරණ නව මෘදුකාංගය එළි දැක්වීම- පොලිස් මූලස්ථානය

ශ්‍රී ලංකා පොලිසිය මඟින් CCTV කැමරා ඔස්සේ රථ වාහන වැරදි සම්බන්ධ නිරීක්ෂණය කර එම රථ වාහන රියදුරන් සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම CCTV කොට්ඨාසය මඟින් දැනටමත් සිදු කරනු ලබන අතර එම ක්‍රියාවලිය කාර්යක්ෂමව හා නව තාක්ෂණය ඔස්සේ පවත්වාගෙන යාම සඳහා නව මෘදුකාංගයක් Prima Management Services (pvt) Ltd ආයතනයේ දායකත්වයෙන් ශ්‍රී ලංකා පොලිසිය වෙත පිරිනැමීම වැඩ බලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් **2025 ජනවාරි 21 වන අද දින උදෑසන CCTV කොට්ඨාසයේදී** පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ප්‍රීමා කළමනාකරණ පුද්ගලික ආයතනයේ සාමාන්‍ය අධිකාරී ක්‍රිෂාන්ත පෙරේරා මහතා, අධ්‍යක්ෂ සුනිල් ලිනියාගොඩ මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකාර ශාමින්ද ඉලංගතිලක මහතා, ජ්‍යෙෂ්ඨ කළමණාකාර රුචිර මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ හා රථවාහන රන්මල් කොඩිතුවක්කු මහතා, නියෝජ්‍ය පොලිස්පති කොළඹ දිසාව එන්.පී. ලියනගේ මහතා, සීසීටීවී දිසාව භාර ටී.පී.ගමලත් මහතා, අධ්‍යක්ෂ පොලිස් මාධ්‍ය කොට්ඨාසය සහ මාධ්‍ය ප්‍රකාශක ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී බුද්ධික මනතුංග මහතා, ඇතුළු ශ්‍රී ලංකා පොලිසියේ උසස් නිලධාරීන් රැසක් සහභාගී විය.

මෙම මෘදුකාංගයේ ක්‍රියාකාරීත්වය සම්බන්ධව CCTV දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති ටී.පී.ගමලත් මහතා බහුමාධ්‍ය ප්‍රක්ශේපණ තාක්ෂණය යොදා ගනිමින් සිදු කරනු ලබන පැහැදිලි කිරීමේ වීඩියෝපටයක් සහ ඡායාරූප කිහිපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.






TRAFFIC VIOLATION REPORTING








**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**